# සීමාසහිත පුත්තලම විවිධ සේවා සමුපකාර සමිතිය

# තනතුරු ඇබෑර්තු

සීමාසහිත පුත්තලම විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුත්තලම සහ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.)

1. **අභ්‍යන්තර විගණක (ග්‍රාමීය බැංකු/විවිධ)**
2. **කළමනාකරු (මානව සම්පත් සංවර්ධන)**
3. **කළමනාකරු ( ව්‍යාපාර සංවර්ධන)**
4. **කළමනාකරු (තොරතුරු තාක්ෂණ)**
5. **විගණක සහකාර**

- මෙම තනතුරු දායක විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරු වන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වීමේ හිමිකම ඇත.
- අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 – 45ත් අතර විය යුතුය. දැනටමත් සමුපකාර සේවයේ නියුක්ත වූවන්ට වයස් සීමාවක් බලපානු නොලැබේ.
- සියලුම තනතුරු වලට අදාළ අධ්‍යාපන, වෘත්තීය සහ වෙනත් සුදුසුකම් පිළිබඳව සීමා සහිත පුත්තලම විවිධ සේවා සමුපකාර සමිතිය මගින් හෝ වයඹ පළාතේ ඕනෑම සමුපකාර සමිතියකින් හෝ වයඹ සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් විමසිය හැකිය.
- තමන් විසින් පිළියෙළ කරන ලද අයදුම්පත සමග ඔබගේ ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය හෝ අනන්‍යතාවය තහවුරු කිරීමට හැකි පිළිගත හැකි ලේඛනයක පිටපතක් සහ අනෙකුත් සහතිකපත්වල පිටපත් (උප්පැන්න සහතිකය, ග්‍රාම නිලධාරී සහතිකය, අධ්‍යාපන, වෘත්තීය, ක්‍රීඩා කුසලතා හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතික ) සමග ගරු සභාපති, සීමාසහිත පුත්තලම විවිධ සේවා සමුපකාර සමිතිය, මස්ජිද් පාර, පුත්තලම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ යුතුය.
- අයදුම්පත බහාලනු ලබන කවරයෙහි ඉදිරිපස වම් කෙළවරෙහි තමා අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2023.11.30 වේ. එදිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

**සභාපති, සී/ස. පුත්තලම වි.සේ.ස. සමිතිය,**
**මස්ජිද් පාර, පුත්තලම.**

**විමසීම් - මානව සම්පත් කළමනාකරු - 032-2265270 / 070-3296572**